<u>මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව</u>
<u>පොළොන්නරුව දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019මැයි 29 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | රාජ්‍ය බැංකු දෙකක ස්ථාවර තැන්පත්වලට අදාලව සභාවට ලැබිය යුතු රු.245,143 ක පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි අගය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ජ'නල් අංක 17 හා 73 යටතේ බැංකුවෙන් ලද ගිණුම් ශේෂය අනුව ගලපා ඇත. |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල උසාවි දඩ ආදායම හා 2018 වර්ෂයට අදාළ අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2018 වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම ලබාදෙන ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ට ලිපි මගින් කිහිප විටකදී දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | ඉකුත් වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව සමුච්චිත අරමුදල් හා ඌණතා ගිණුමේ ශේෂය රු.34,506,547 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ ආරම්භක ශේෂය රු.31,814,523 ක් ලෙස රු.2,692,024 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය හඳුනාගෙන ආරම්භක ශේෂ සටහන් කළ යුතුවේ. | පිළිගනිමි. |
| **(iv)** | සභාව භාවිතා කරන ඉඩම් 50 ක් හා ගොඩනැගිලි 45 ක වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කළයුතු වේ. | ඉඩම් අයිතිය ලබාගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන අදාළ ආයතන වෙත යොමුකර ඇත. |

**(ආ)** නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | යන්ත්‍ර හා පිරියත ලේඛනයේ බැකෝලෝඩරයේ වටිනාකම රු.16,695,000 ක් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති උපලේඛනය අනුව රු.16,950,000ක් ලෙසද දක්වා තිබීමෙන් ශේෂයන් අතර රු.255,000ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කළ බව දන්වමි. |
| **(ii)** | ණයගැති ලේඛනයට අනුව පොදු හා කර්මාන්ත ණයගැති ශේෂය රු.1,307,984 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති උපලේඛනයේ ශේෂය රු.30,433,898 ක් වූයෙන් රු.29,125,914 ක නොසැසඳීමක් පැවතුණි. | ලේඛන හා උපලේඛන සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(iii)** | ණයහිමි ලේඛනයට අනුව විවිධ හා කර්මාන්ත ණයහිමි ලේඛනයේ ශේෂය රු.2,133,534 ක් වූ නමුත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයහිමි උපලේඛනයේ ශේෂය රු.32,814,426 ක් වූයෙන් රු.30,680,892 ක නොසැසඳීමක් පැවතුණි. | ලේඛන හා උපලේඛන සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(iv)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල්වලට සමාන දැඟි අගය රු.16,601,666 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ශේෂපත්‍රයේ සටහන් අංක 11 හි මුදල් හා මුදල් වලට සමාන දැඟි අගය රු.19,928,960 ක් ලෙස දක්වා තිබීමෙන් රු.3,327,294 ක නොසැසඳීමක් පැවතුණි. | අදාළ වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුවේ. | පිළිගනිමි. ස්ථිර තැන්පත් ශේෂද මුදල් හා මුදල් හා සමාන දෑ තුළ ඇතුළත් වී ඇත. |

| | | | |
|---|---|---|---|
| **(v)** | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යප්‍රකාශනවලට අනුව සම්මුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.32,437,701 ක් වුවත්, ලෙජරයට අනුව එම ශේෂය රු.34,506,547 ක් වූයෙන් රු.2,068,846 ක නොසැසඳීමක් පැවතුණි. | අදාළ වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුවේ. | පිළිගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
--------------------------------------------------

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ------------ | ---------------- |
| තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම<br>-------------------------------------------- | | |
| වටිනාකම රු.126,884,602 ක් වූ ගිණුම් විෂයන් 06 කට අදාලව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂවලට අදාළව තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| **(i)** | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු 1997-2017 වර්ෂවල සිට පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂ 20 කට අදාලව එකතුව රු.259,814 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බදුකරුවන් මියයාම හා පදිංචිය හැරයාම හේතුවෙන් රු.23,911 ක් අයකර ගැනීමට නොහැකි ලෙස සලකා කපාහැරීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේදී රු1,519 ක් අයකර ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කර්මාන්ත ණයගැති ශේෂ 04 කට අදාලව එකතුව රු.1,361,024 ක් වර්ෂ 1 – 2 ක් පමණ කාලයක සිට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි. අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(iii)** | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කර්මාන්ත ණයහිමි ශේෂ 08 කට අදාලව එකතුව රු.1,693,026 ක් වර්ෂ 1 -2 ක් පමණ කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේදී රු.365,100 ක් නිරවුල් කර ඇති අතර ඉතිරිය නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| **(iv)** | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වටිනාකම රු. 1,864,825 ක් වූ ටෙන්ඩර් තැම්පත් ශේෂ 79 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(v)** | 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වටිනාකම රු.1,265,119 ක් වූ කර්මාන්ත තැන්පත් ශේෂ 10 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ----------------------- | | -------------- | ----------------- |
| | නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| | ---------------------- | ------------------ | | |
| **(අ)** | 1987අංක15දරන ප්‍රාදේශීය සභා පනත<br>----------------------- | | | |
| **(i)** | 147 හා 149 වගන්ති | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බොහෝ | සියලුම ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු | ලැයිස්තුවක් සකස්කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | අය කිරීමට කටයුතු කළ යුතුවේ. | |
| **(ii)** | 150 (i), 152(i) හා 153(i) වගන්ති | සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳ ලැයිස්තු පිලියෙල කර නොතිබුණි. | අදාළ ලැයිස්තු පිළියෙළ කිරිමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර සඳහා ලැයිස්තු පිළියෙල කර ඇති අතර වෘත්තීන් හා සංවර්ධනය නොකරන ලද ඉඩම් සඳහා ලැයිස්තු පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| **(iii)** | 158 වගන්තිය | හිඟ වරිපනම් බදු නොගෙවීම සම්බන්ධයෙන් වරෙන්තු නිවේදන නිකුත් කර නොතිබුණු අතර, ප්‍රමාද වී ගෙවනු ලබන වරිපනම් සඳහා දඩ මුදල් අයකිරීම ද සිදුකර නොතිබුණි. | වරිපනම් බදු නොගෙවීම සම්බන්ධයෙන් වරෙන්තු නිවේදන නිකුත් කිරීමට හා ප්‍රමාද වී ගෙවීම් සම්බන්ධ දඩ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. වරෙන්තු නිවේදන නිකුත්කර නොතිබුණු බැවින් ප්‍රමාද වී ගෙවනු ලබන වරිපනම් සඳහා දඩ මුදල් අය කිරීමට නොහැකි වී ඇත. |
| **(ආ)** | 1988ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය<br>------------------------- | | | |
| | රීති අංක 203, 214 හා 218 | සභාවේ දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් සිදුකල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ අවසන් කර ඇති අතර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රීලංකාප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 1645(ආ) ඡේදය | සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු. 150,427 ක් වූ වාහන අලුත්වැඩියාවන් සහ අමතර කොටස් මිලදී ගැනීම් 07 ක් සම්බන්ධව ලොග් සටහන් පොත්වල සටහන් කර නොතිබුණි. | ලොග් පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.5** ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක ඇප තැන්පත් ගිණුමේ ශේෂය වූ රු.81,836 ක මුදල ප්‍රමාණවත් අධිකාරි බලයකින් තොරව ජ'නල් අංක 5 මඟින් සේවක ඇප තැන්පත් ගිණුමෙන් ඉවත් කර තිබුණි. | සේවක ඇප තැන්පත් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේදී අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,733,289 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,123,961 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 .දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 . දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,946,160 | 3,428,682 | 3,197,660 | 3,997,322 | 2,622,000 | 2,945,700 | 2,594,159 | 3,766,601 |
| (ii) | කුලී | 5,679,440 | 9,318,248 | 9,087,225 | 261,691 | 7,551,000 | 4,406,499 | 4,406,499 | 259,815 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 495,000 | 244,709 | 244,709 | - | 465,000 | 152,979 | 152,979 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,161,650 | 11,815,145 | 11,584,123 | 10,845,837 | 10,119,500 | 9,713,280 | 9,713,280 | 19,557,724 |
| (v) | වැටුප් ප්‍රතිපූර්ණය | 45,762,000 | 27182,874 | 26,951,852 | - | 28,764,000 | 22,921,626 | 22,921,626 | - |
| (vi) | වැටුප් ප්‍රතිපූර්ණය සමඟ වෙනත් ආදායම් | 57,923,650 | 38,998,020 | 38,766,998 | - | 38,883,500 | 32,634,907 | 32,634,907 | 19,557,724 |
| | එකතුව | 124,967,900 | 90,987,678 | 89,832,567 | 15,104,850 | 88,405,000 | 72,774,991 | 72,423,450 | 43,141,864 |

**2.2.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් රු.124,967,900ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද,රැස්කර තිබූ ආදායම රු.89,832,567ක් වූ අතර,එය ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 72ක් වී තිබුණි. | ආදායම් ඇස්තමේන්තු සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

**2.2.3** වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ ලේඛන අනුව | හිඟ වරිපනම් බදු ආදායම් | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | අයවිය යුතු හිඟ වරිපනම් මුදල රු.3,343,695 ක් වූ අතර, 2017 වර්ෂයට සාපේක්ෂව එම හිඟ ශේෂය සියයට7කින් වර්ධනය වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට අයවිය යුතු හිඟ ජල බදු මුදල රු.653,628 ක් වූ අතර, එම බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | හිඟ ජල බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යවසායකයින් 33 දෙනෙකුගෙන් අයකර ගැනීමට හැකිව තිබූ රු 82,800.ක ව්‍යාපාර බදු ආදායමක් ,රැස්කර ගැනීමට සභාව අපොහොසත්ව ඇති බව සමීක්ෂණ වාර්තා අනුව අනාවරණය විය . | ව්‍යාපාර බදු අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. | විගණනයේ උපදෙස් අනුව අයකිරීමට කටයුතු කරමි. |

**2.2.4** කුලී

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත්බැකෝලෝඩරය, මෝටර් ග්‍රේඩරය, ලොරි ජල බවුසරය ටිපර් රථය කුලී පදනම මත සේවයේ යොදවා ඇතත්,ඒ වෙනුවෙන් අයවිය යුතු රු.989,155 ක මුදල 2018 දෙසැම්බර් 27දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. | රු.209,100 ක් 2019 වර්ෂයේදී අයකරගෙන ඇති අතර රු.21,900 ක් පොදු කටයුතු වලට අදාළ වේ. ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** වෙනත් ආදායම්

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශය පුරා විවිධ ආයතන විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරු විශාල ප්‍රමාණයක් පැවතුන නමුත් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් අවසන් වන විට අයකර තිබුණේ ප්‍රචාරක දැන්වීම් පුවරු 17කින් රු40, 747 ක ආදායමක් පමණි. | ප්‍රදේශයේ සියළුම දැන්වීම් පුවරු මඟින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයක් සිදුකර අදාළ පුද්ගලයන්ට ගාස්තු ගෙවන ලෙස දන්වා ගාස්තු නොගෙවූ |

| | | | |
|---|---|---|---|
| | | | දැන්වීම් පුවරු ඉවත්කර ඇත. |
| **(ආ)** | සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ත්‍රීරෝද රථ ගාල්වලින් සභාවට අයවීමට තිබූ ආදායම් අතුරු ව්‍යවස්ථා පනවා නීත්‍යානුකූල කිරීම තුළින් අයකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු භූමියක් නොමැති නිසා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමේ හැකියාව පිළිබඳ ගැටළු පවතින බව දන්වමි. |

**2.2.6** උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,496,103 ක් හා මුද්දර ගාස්තු රු.4,349,737 ක් විය. | සියළුම උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන සභාවට ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාදෙන ලෙස පළාත් භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර ඇත. |

**3** මෙහෙයුම් සමාලෝචනය

---------------------------

**3.1** කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126වගන්තිය යටතේ සභාව විසින් ඉටුකළ යුතු කර්තව්‍යයන්ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018දෙසැම්බර් 31දින වන විටත් කාරණා 10 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා එම කටයුතු නියාමනය කළ යුතුවේ. | පිළිගනිමි. |

**(ආ)** ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් 11 ක් සඳහා පමණක්, වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 04 ක් ඉටු කල නොහැකි වී තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කිරීමට ප්‍රතිපාදන වෙන්කළ යුතුවේ. | පිළිගතිමි. |

**(ඇ)** තිරසාර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු හඳුනාගත යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රපලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |
| (iii) | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබූ බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | දත්ත එක්රැස් කිරීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |
| (iv) | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (v) | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණු කටයුතු නිසි පරිදි සිදුකළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| **(අ)** | ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ, දිවුලන්කඩවල සතිපොළ රු. 2,247,853 ක වියදමකින් ඉදිකර තිබුණද, 2018 දෙසැම්බර් 31 වන විටත් වසර 04 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| **(ආ)** | නීත්‍යානුකූල කර නොගන්නා ඉදිකිරීම් හා නීත්‍යානුකූල කර ගැනීමට ප්‍රමාදව පවතින අනවසර ඉදිකිරීම්වලින් දඩ මුදල් අයකිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | ඉදිකිරීම් කටයුතු නීත්‍යානුකූල කර දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිකිරීම් නීත්‍යානුකූල කරගන්නා ලෙස දැනුම් දී ඇත.ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගැනීමට පැමිණියද ඔවුන්ට ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| **(අ)** | ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර 2017 ඔක්තෝබර් 21දින සිට වැඩබලන ලේකම්වරියක එම තනතුරේ රාජකාරී ආවරණය කරමින් තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම පුරප්පාඩුව සම්බන්ධව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා උතුරුමැද පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| **(ආ)** | ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරීන් තනතුරු 03 ක් කාර්මික නිලධාරී තනතුරක්, පුස්තකාලාධිපති තනතුරක්, වැඩ පරික්ෂක තනතුරක් සහ පෙර පාසල් ගුරු තනතුරක් වශයෙන් තනතුරු 07 ක් පුරප්පාඩුව පවතින අතර, අනුමත කාර්ය මණ්ඩලයතුළ නොවූ තනතුරු 02 ටබඳවාගැනීම් සිදුකර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු පිරවීමටත් අවශ්‍යතාව මත කාර්යමණ්ඩලය සංශෝධනය කර අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | එම තනතුරු සඳහා නිළධාරීන් ලබාදෙන ලෙස ලිපි මගින් ඉල්ලීම් කර ඇති අතර එම තනතුරුවල වැඩ ආවරණය කරගැනීම සඳහා අතිරික්ත කාර්ය මණ්ඩල යොදවාගෙන ඇත. |
| **(ඇ)** | ප්‍රාථමික මට්ටමට අයත් රියදුරු ,ජල කාර්මික සහජල පොම්ප ක්‍රියාකරු වශයෙන් තනතුරු 03ක පුරප්පාඩු පවතින අතර ,අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ කාර්යාල කාර්යය සහායක තනතුරු 02ක් ,ක්ෂේත්‍ර කම්කරු තනතුරක් , සෞඛ්‍ය කම්කරු තනතුරක් සහ පුස්තකාල සහායක තනතුරු 05ක් වශයෙන් පුද්ගලයින් 09 ක්බඳවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු පිරවීමටත් අවශ්‍යතාව මත කාර්යමණ්ඩලය සංශෝධන කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාව මගින් කළයුතු රාජකාරි ප්‍රමාණය සංකීර්ණ වීමත් පිළිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමඟ අතිරික්ත කාර්ය මණ්ඩලයක් යොදවා ගැනීමට සිදුවී ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ තනතුරු 07ක් සඳහා අනියම් පදනම මත සේවකයන් 07 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අවශ්‍යතාව මත කාර්යමණ්ඩලය සංශෝධන කර අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති වෙනුවෙන් සහ කසළ බැහැර කිරීම විධිමත්ව කරගෙන යාම සඳහාත් අනියම් කාර්ය මණ්ඩලයක් යොදවාගෙන ඇති අතර අනුමත කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීම සඳහා පලාත් පාලන දෙපාර්තමේන්තු වෙන් ඉල්ලීම් කර ඇත. |

**(ඉ)** සේවක ණය

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018දෙසැම්බර් 31දින වන විට අයනොවී පවතින රු.45,026 ක් වූ සේවක ණය ශේෂයන් 02 ක් අදාල නිලධාරියාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය අයකර ගැනිමට ආයතන සංග්‍රහයේ විදිවිදාන ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතුවේ. | නිළධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු 21,147 ක ණය අයකර ඇති අතර මියගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු.32,679 ක් කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇත. |

**3.4** වත්කම් කළමනාකරණය

----------------------------

**3.4.1** වත්කම් ලේඛනගත කිරීම

--------------------------

| | | | |
|---|---|---|---|
| **(අ)** | රු.733,500 ක් වූ යන්ත්‍රෝපකරණ ශේෂ 06 ක වටිනාකමද රු.259,427 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ ශේෂ 08 ක වටිනාකමද රු.32,400 ක් වූ පරිගණක මොනිටර් 02 ක වටිනාකමද අදාළ | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාවර වත්කම් ලේඛනවල සටහන් කර නොතිබුණි. | | |

**3.4.2** වාහන උපයෝජනය

| | | | |
|---|---|---|---|
| **(අ)** | සභාව සතු වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරික්ෂා කර වාහන ලොග් සටහන් පොත්වල සටහන් කර නොතිබුණි. | දැවෙන ඉන්ධන ප්‍රමාණය පරික්ෂා කර ලොග් සටහන් පොත්වලසටහන් කළ යුතුවේ. | වාහන කීපයක ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |
| **(ආ)** | සභාව විසින් භාවිතා කරනු ලබන රථ වාහන 02 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රථ වාහන 02 ක් සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දන්වා ඇති අතර ණය පදනම මත ලබාගත් රථයේ ලියාපදිංචි සහතිකය අදාළ මූල්‍ය ආයතනයේ පවතින බව දන්වමි. |

**3.4.3** නිශ්ක්‍රිය හා ඌන උපායෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් රථ වාහන 03 වර්ෂ 1 ත් 10 ත් අතර කාලසීමාවක් තුළ සිට නිශ්කාර්යව හා ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් පැවතුණි. | භාවිතයට ගතහැකි වත්කම් කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමටත්, භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | රථවාහන දෙකක් අළුත්වැඩියා කිරීමටත් එකක් ප්‍රධාන ලේකම් කාර්යාලයට යැවීමටත් අවශ්‍ය කටයුතු කරමි. |

**4** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**4.1** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 09 සිට සියයට 74 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 6 සිට සියයට 96 දක්වාද විචලනය පැවතුණි. | අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුවේ. | පිළිගතිමි. 2019 වර්ෂයේදී නිවැරදි කර දැක්වීමට කටයුතු කරමි. |

**4.2** විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සිපී/සීඑස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මගින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා තිබුණද, 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි. | මාස 02 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | පිළිගෙන ඇත. 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන බව දක්වා ඇත. |